

# මායා බෝතලය

පූහානි යසස්මා විජේකෝන්

# මායා බෝතලය

යුගානි යසස්මා විජේකෝන්

## කතෘගේ වෙනත් කෘති

සමනළයා සහ මී මැස්සා

අපේ සෙල්ලම් ගෙදර

මහාමායා බාලිකා විදුහල,මහනුවර

6 ශ්‍රේණිය

2025-02-08

ISBN -978-624-208-885-3

# පිදුම

නිති දැනුමෙන් පෝෂණය කරන්නට වෙර දරන,

මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,

පන්තිභාර ගුරුතුමිය ,

ඇතුළු ගුරු මව්පියවරුන්ටත්,

මා පෝෂණය කරන, ඇතිදැඩි කරන

මාගේ මව්නි,පියාණෙනි ඔබ දෙපළටත්,

මා වැනිම දැනුම හඹා යන

මාගේ සොයුරු කැළටත්

මේ පොත ආදරයෙන් පුද කරමි.

*********



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එක දවසක් පුංචි ගැනු ළමයෙක් පළතුරු ටිකක් එකතු කරගන්න කියලා කැලෑවට ගියා. ඊට පස්සේ එයා පලතුරු හොය හොය ඉන්නකොට එයාට අසරණ වෙච්ච ආච්චි කෙනෙක් හම්බවුණා.



ඊට පස්සේ ඒ ආච්චි පුංචි ගෑණු ළමයාට කිව්වා අනේ පුංචි ළමයෝ මට වතුර ටිකක් දෙන්න පුළුවන්ද කියලා ඇහුවා ඊට පස්සේ පුංචි ගෑණු ළමයාට ඒ අසරණ ආච්චි ගැන දුක හිතුණා. ඊට පස්සේ ඒ අසරණ ආච්චිට එයා වතුර ටිකක් දුන්නා.



අනේ දුවේ ඔයාට ගොඩක් ස්තූතියි. ඒක සුළු දෙයක්නේ. ඔයා මේ කරපු දේ වෙනුවෙන් මම මොනාද ඔයාට කරන්න ඕනේ.

" එහෙම ඕන්නෑ අච්චි.... මේක මම කරේ කිසි දෙයක් බලාපොරොත්තුවෙන් නෙවෙයි."

"ඒකට කමක් නෑ. ඔයා මේ බෝතලේ ගන්නකෝ, මේ බෝතලය ඔයාට ගොඩක් වටිනවා.... මොකද කියනවනම් මේ බෝතලේ එසේ මෙසේ බෝතලයක් නෙවෙයි. මේකෙන් අපිට ඕන දෙයක් මවන්න පුළුවන්."



ඔයා මේක අරගෙන තුන් පාරක් අනේ පුංචි බෝතලේ කියලා මතුරලා ඔයාට ඕන දේ කියන්න එතකොට ම මේකෙන් ඔයාට ඕන දේ මැවෙයි.

“අනේ ගොඩක් ස්තුතියි ආච්චි.”

කියලා මේ පුංචි ගෑණු ළමයා බෝතලේ ගත්තා.

ඊට පස්සේ මේ පුංචි ගෑණු ළමයා මේ බෝතලෙත් අරගෙන ගෙදර ගියා.

ඊට පස්සේ අර ආච්චි කිව්වා වගේ තුන් පාරක් මතුරලා බැලුවා. “අනේ පුංචි බෝතලේ, අනේ පුංචි බෝතලේ ,අනේ පුංචි බෝතලේ ,අනේ පුංචි බෝතලේ මට පලතුරු ටිකක් මවලා දෙන්න,” කියල කිව්වා. එතකොට එක පාරට ම පලතුරු ටිකක් මැවුනා.පුංචි ගෑනු ළමයා පුදුම වුණා.



ඊට පස්සේ මේ පුංචි ගෑණු ළමයා පලතුරු ටික කාලා මායා බෝතලය මේසය උඩින් තිබ්බා ඊට පස්සේ මේ පුංචි ගෑණු ළමයා එළියේ ඇවිදින්න ගියා.

ඒ අතරේ මේ පුංචි ගැණු ළමයාගේ අම්මා ගෙදරට ආවා. ඊට පස්සේ ඒ අම්මා දැක්කා මේසය උඩ බෝතලයක් තියෙනවා. ඊට පස්සේ අම්මා මේ බෝතලය වැඩක් නැති වෙයි කියලා විසිකරා.ඊට පස්සේ පුංචි ගැනු ළමයා ගෙදර ආවා. එයා ආවට පස්සේ එයා මේ සය උඩින් තිබ්බ බෝතලය තිබුනෙ නෑ.

ඊට පස්සේ එයා ඒ බෝතලය  හැම තැනම හෙව්වා ඒත් එයාට කොහෙවත් ඒක තිබිලා හම්බුනේ නෑ. එයාට ගොඩාක් දුක හිතුනා. ඊට පස්සේ එයා අම්මගෙන් ඇහුවා මේ බෝතලය දැක්කද කියලා.

ඊට පස්සේ අම්මා කිව්වා මං ඒක දැක්කා ඊට පස්සේ මං හිතුවා ඒක වැඩක් නැති වෙයි කියලා මම ඒක එලියට විසිකරා පුංචි ගෑණු ළමයට ගොඩක් දුක හිතුනා ඊට පස්සේ එයා එළියට ගිහින් අඬන්න පටන් ගත්තා.

ඊට පස්සේ එක පාරටම අර ආච්චි එයා ඉන්න තැනින් මතු වුණා. ඊට පස්සේ පුංචි ගෑනු ළමයා ගොඩක් බය වුණා.  ඊට පස්සේ එයා ඇහුවා මොකක්ද ඔයාගේ ප්‍රශ්නේ කියලා පුංචි ගෑනු ළමයා කිව්වා මං ගාව තිබ්බ අර මායා බෝතලය අම්ම එළියට විසි කරලා ඒක දැන් කැඩිල දන්නෑ කියල කිව්වා.

ඊට පස්සේ ඒ ආච්චි එතනින් ගිහිල්ලා ආපහු සැරයක් මතුවෙලා ඒ මායා බෝතලය අරගෙන ආවා. ඊට පස්සේ පුංචි ගෑනු ළමයා ගොඩක් සතුටු වුනා.

ඊට පස්සේ පුංචි ගෑනු ළමයා ආච්චිට ස්තූති කරලා බෝතලය ගත්තා. ඊට පස්සේ ආච්චි එතනින් එකපාරටම අතුරුදහන් වුණා. ඊට පස්සේ මේ පුංචි ගෑනු ළමයායි එයාගේ අම්මයි සතුටින් ජීවත් වුණා.

****



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ සැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ISBN 978-624-208-885-3

ව්‍යාපෘති නිර්මාත්‍ය සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්